UNIVERSITY HOSPITAL
General Sir John Kotelawala Defence University

## ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය

# පුරප්පාඩු

**ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල වෙත පහත සදහන් තනතුර සදහා අදාල සුදුසුකම්ලත් අයවලුන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**
**(පැයට ගෙවීමේ පදනම මත)**

## 1. හෙද සහායක

**<u>සුදුසුකම්:</u>**

I. දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

සහ

II. අ. ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය (NAITA) මගින් පවත්වනු ලබන වෘත්තිය සුදුසුකම් කාණ්ඩ අංක 03 හෝ 04 (NVQ 03 හෝ 04) හෙද සහායක පාඨමාලාව සම්පූර්ණ කර තිබීම.

හෝ

ආ. තෘතියික හා වෘත්තිය අධ්‍යාපන කොමිෂන් සභාවෙහි (TVEC) ලියාපදිංචි ආයතනයක් මගින් පවත්වනු ලබන හෙද සහායක පාඨමාලාව සම්පූර්ණ කර තිබීම.

හෝ

ඇ. ශ්‍රී ලංකා පෞද්ගලික වෛද්‍ය නියාමන සභාව යටතේ ලියාපදිංචි වී ඇති හෙද පුහුණු ආයතනයකින් හෙද සහායක පාඨමාලාව සම්පූර්ණ කර තිබීම.

සහ

III. අවම වශයෙන් මාස හයක (06) සෞඛ්‍ය සේවයේ සේවා පළපුරුද්දක් ලබා තිබීම.

**<u>අමතර සුදුසුකම්:</u>**

I. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් ගණිතය, විද්‍යාව හා ඉංග්‍රීසි භාෂාව යන විෂයයන් සදහා සම්මාන සාමාර්ථයක් ලබා තිබීම.
II. සෞඛ්‍ය ක්ෂේත්‍රයේ රෝගී සත්කාර හා රසායනාගාර සේවයේ පළපුරුද්දක් ලබා තිබීම විශේෂ සුදුසුකමක් වශයෙන් සලකනු ලැබේ.
III. තොරතුරු තාක්ෂණය හා පරිඝණක දැනුම පිළිබඳව ඇති හැකියාව.

**වයස් සීමාව:**

අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 40 ට නොවැඩි අය විය යුතුය.

**වැටුප් පරිමාණය:**

පැයකට රු.250.00 ක් වශයෙන් ගෙවනු ලැබේ. සේවා අවශ්‍යතාවය මත උපරිමය මසකට පැය 300 දක්වා සේවය කළ හැක.

**පොදු කොන්දේසි**

1. නිසි අයුරින් සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය සමගින් සහතික කරන ලද අධ්‍යාපන, වෘත්තීය සහ සේවා සහතික වල ඡායා පිටපත් ලියාපදිංචි තැපෑලෙන් **2026.08.07** වන දින හෝ එම දිනට පෙර **"විධායක අධ්‍යක්ෂ, විශ්වවිද්‍යාල රෝහල, ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාලය, වේරහැර"** යන ලිපිනයට යොමු කළ යුතු අතර, ලියුම්කවරයේ ඉහළ වම් කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

2. අයදුම්කරුවන් කෙටි ලැයිස්තු ගත කිරීමේ අයිතිය ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල සතුවේ. අසම්පූර්ණ, ප්‍රමාද වී යොමු කරනු ලබන සහ ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල රෝහල් ආකෘතියට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

3. පූර්ණකාලීනව පැයට ගෙවීමේ පදනම මත බඳවා ගනු ලබන අතර සේවය සතුටුදායක නම් සේවය දීර්ඝ කිරීමට කටයුතු කරනු ලැබේ.

4. අයදුම්පත්‍ර භාගත කර ගැනීමට සහ වැඩි විස්තර සඳහා ජෙනරාල් ශ්‍රීමත් ජෝන් කොතලාවල ආරක්ෂක විශ්වවිද්‍යාල වෙබ් අඩවියට පිවිසෙන්න.www.kdu.ac.lk / දුරකථන අංකය – 0112044555.

**www.kdu.ac.lk**